# අඟහරුවාදා

## පළමුවන කියැවීම

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ඉසයියස් 55: 10 – 11

**"මාගේ වචනය මා වෙත හිස්ව නොපැමිණේ."**

"අහසින් වැටෙන හිම හා වහින වැස්ස නැවත හැරී නොගොස් පොළොව සරුසාර කර, පැළ නංවා කරල් හටගන්වා වපුරන්නාට ධාන්‍ය ද, මිනිසාට ආහාර ද ගෙන දෙයි. එලෙස මා මුවින් නික්මෙන වචන මා වෙත ම හිස්ව නොපැමිණෙන මාගේ අදහස් සඵල කර නියමයන් සිකුරට ම ඉටු කරයි."

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 34: 3–6, 15–18

පිළිතුර: සමිඳාණෝ දැහැමියන් සියලු ආපදාවලින් මුදා හරින සේක.

ගීය:

ඔබ මා සමඟ හිමිතුමන් වර්ණනා කරන්න. අපි එක් වී එතුමන්ගේ නාමය පසසමු. මම හිමිතුමන් සොයා ගියෙමි. එතුමාණෝ මට පිළිතුරු දී හැම බියෙන් මා මිදූ සේක.

එතුමන් දෙස බලන්නා ප්‍රීතියෙන් බැබළෙන්නේය. ඔහුගේ මුහුණ කවදාවත් ලජ්ජාවෙන් අඳුරු නොවන්නේය. හිමිතුමන්ට කන්නලව්

කළ එක් අසරණයෙන් විය. එතුමාණෝ ඔහුගේ බස් අසා සියලු දුක් ගැහැටවලින් ඔහු මිදූ සේක.

හිමිතුමන්ගේ දෙනෙත දමිටුන් දෙසට ද එතුමන්ගේ දෙසවන ඔවුන්ගේ කන්නලව්වට ද යොමා ඇත. පව්කම් කරන අය පොලොවෙන් අමතක වී යන ලෙස හිමිතුමාණෝ ඔවුන්ට විරෝධය දක්වන සේක.

දැහැමි අය අයැදුම් කළහ. හිමිතුමාණෝ සවන් දී සියලු දුක් වේදනාවෙන් ඔවුන් මිදූ සේක. හිමිතුමාණෝ බිඳුණු සිත් ඇත්තන්ට ළංව සිටින සේක. තැළුණු හදවත් ඇත්තන්ට පිහිට වන සේක.

## සාධුකාරය

ජිවත් වන පිණිස නපුර නොව යහපත සොයන්න.
එවිට සියලු බලැති දෙවි සමිඳාණන් වහන්සේ ඔබ සමඟ සිටින සේක.

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 6 : 7-15

***"ඔබ මෙසේ යාච්ඤා කළ යුතුය."***

"තවද, යාච්ඤා කිරීමේ දී විජාතීන් මෙන් දිගින් දිගට හිස් වචන නොදොඩන්න. ඔවුන් දොඩන වචන රාශිය නිසා දෙවියන් වහන්සේ ඔවුන්ට කන් දෙනු ඇතැයි ඔව්හු සිතති. ඔවුන් හා සමාන නොවන්න. ඔබ ඉල්ලන්නටත් පෙර ඔබේ වුවමනා කවරේ දැ"යි පියාණන් වහන්සේ දන්නා සේක. එහෙයින් මෙසේ යාච්ඤා කරන්න.

ස්වර්ගයෙහි වැඩ වසන අපගේ පියාණෙනි,
ඔබගේ නාමයට ගෞරව වේවා.
ඔබගේ රාජ්‍යය පැමිණේවා.
ඔබගේ කැමැත්ත ඉටු වේවා.
ස්වර්ගයෙහි මෙන් පොළොවෙහි ද එසේම වේවා.
අපගේ දවස් පතා භෝජනය අද අපට දුන මැනව.
අපට වරද කළ අයට අප කමා කළාක් මෙන් අපේ වරදට අපට කමා වුව මැනව. අප පරීක්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප මිදුව මැනව.

"ඔබ මිනිසුන්ට ඔවුන්ගේ වරද කමා කරන්නහු නම් ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ ඔබටත් කමා කරන සේක. එහෙත් ඔබ මිනිසුන්ට ඔවුන්ගේ වරදට කමා නොකරන්නහු නම් පියාණන් වහන්සේ ඔබේ වරදටත් කමා නොකරන සේක.

**සුවිශේෂ** වාක්‍යය එසේ ය.